**ගොවිජන සංවර්ධන අරමුදල - 2022**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගොවිජන සංවර්ධන අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ.

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 පෙබරවාරි 10 දින ජලධාරා ඇල්බම් හා අත්පොත්වල භෞතික තොග පරීක්ෂාවේදී රු.32,000 ක් වූ ජලධාරා ඇල්බම් 08 ක් සහ රු. 37,120 ක් වූ ජලධාරා අත්පොත් 116 ක ඌනතාවයක් වූ අතර එහි එකතුව වූ රු. 69,120 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කර නොතිබුණි. | ජලධාරා අත්පොත් හා ජලධාරා තොග පිළිබඳ ඉංජිනේරු භෞතික තොග ශේෂ වාර්තාව මත ගැලපීම් සිදු කළද 2023.02.10 දින තොග සත්‍යාපන තොග ශේෂ පිළිබඳ තොරතුරු යාවත්කාලීන නොවීම මත මෙම ඌනතාවය හටගෙන ඇත.2023 වර්ෂයේ නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කරන බව දන්වනු ලැබේ. | භෞතික තොග ඌනතාවය හදුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | පසුගිය වර්ෂයේ රු. 76,830 ක නිලධාරී පුහුණු කිරීමේ වියදම සමුච්චිත අරමුදලට ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දැක්වීම හේතුවෙන් අදාළ වියදම් ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | අත්තිකාරම් පියවීම කරනු ලබන වර්ෂය පදනම් කරගනිමින් වියදම් හදුනාගනු ලැබේ. ඒ අනුව අදාළ වර්ෂවල අයවැයෙහි ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් එම වියදම් දැරීම සිදුකරනු ලබයි. | වියදම අදාළ වර්ෂවලදි ගැලපීම් කළ යුතුය. |
| (ඇ) | පසුගිය වර්ෂයේ පෙබරවාරි 23 දින අම්පාර ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙත සායින්දමරුදු ගොවිජන සේවා මධ්‍යස්ථානයේ වැට ඉදිකිරීමට ලබාදුන් රු. 244,000 ක අත්තිකාරම් මුදලින් එම වර්ෂයේදීම දරා ඇති රු. 243,544 ක වියදම සමුච්චිත අරමුදලට ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සැපයුම් වැඩිදියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අත්තිකාරම් පියවීම වර්ෂය පදනම් කර ගෙන වියදම් හදුනාගනු ලැබේ. ඒ අනුව අදාළ වර්ෂවල අයවැයෙහි ප්‍රතිපාදන උපයෝගි කර ගනිමින් එම වියදම් දැරීම සිදුකරනු ලබයි. | වියදම අදාළ වර්ෂවලදි ගැලපීම් කළ යුතුය. |
| (ඈ) | පසුගිය වර්ෂය වෙනුවෙන් ලැබී ඇති රෝද 02 ට්‍රැක්ටර් වාරික ආදායම වූ රු. 4,012,507 ක් හා 2KR ජල පොම්ප වාරික ආදායම වූ රු.3,020 ක් ලෙස එකතුව රු. 4,015,527 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන තිබුණි. | එක් එක් වර්ෂයට අදාළ වාරික ආදායම් පුරෝකථන අදාළ වර්ෂයේ අයවැයෙහි ඇතුළත්ව ඒ මත පදනම්ව අදාළ වර්ෂයේ වියදම් සිදු කරනු ලබයි. ඒ අනුව වර්ෂය තුළ දී ලැබෙන වාරික ආදායම් සමුච්චිත අරමුදලට බැර නොකර වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කරන ලදි. | ආදායම් අදාළ වර්ෂයට ගැලපීම් කළ යුතුය. |
| (ඉ) | 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු අක්කර බදු සියයට 20 ක ආදායම රු. 15,738,225 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන තුළ එම ආදායම රු. 3,466,975 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. මෙයින් රු.93,427 ක් සමාලෝචිත වර්ෂයටද, රු. 3,373,548 ක් ඉකුත් වර්ෂයටද අදාළ බව වැඩි දුරටත් නිරීක්ෂණය කෙරේ. | සේවා අංශය මගින් 2022 දෙසැම්බර් 31 ලබා දුන් තොරතුරු අනුව අදාළ ගැලපුම් කර ඇති අතර, 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය මගින් අදාළ ගැලපීම් සිදු කරනු ලැබේ. | වර්ෂයේ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ගොවිජන සංවර්ධන අරමුදල සතු දැනට ක්‍රියාකාරී තත්ත්වයේ පවතින පිරිවැය රු. 12,468,763 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද මෙම වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි. | ඉදිරියේදී ගොවිජන සංවර්ධන අරමුදල සතු වත්කම් ප්‍රත්‍යාගණනය කර අවශ්‍ය ගැලපුම් සිදුකිරීමට කටයුතු කරනු බව දන්වනු ලැබේ. | සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | 2023 පෙබරවාරි 10 දින ජල කළමනාකරණ අංශයේ සිදු කළ භෞතික පරීක්ෂාවේදී රු. 305,000 ක් වටිනා වගා කන්න රැස්වීම් සහ සුළු වාරිමාර්ග නඩත්තු පොත් 3,050 ක් පැවතියද ඒවා ලේඛනගත කර තොගවලට ඇතුළත් කර නොතිබුණි. | 2023.02.10 දින සිදු කළ භෞතික තොග සත්‍යාපන තොරතුරු යාවත්කාලීන නොකිරීම මත රු. 305,000ක් වටිනා වගා කන්න රැස්වීම් හා සුළු වාරිමාර්ග නඩත්තු පොත් 3050 ගිණුම්ගත කිරීමට නොහැකි වී ඇත. ඉදිරියේදී ගිණුම්ගත කරමි. | ගිණුම්ගත නොකළ පොත් තොග ගිණුම්ගත කළ යුතුය. |

1.5.2 **පැහැදිලි නොකළ වෙනස්කම්.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ පොත් අනුව තැන්පත් ගිණුමේ ශේෂය රු. 338,115,488 ක් වුවද, භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු. 338,767,636 ක් විය. ඒ අනුව දීර්ඝ කාලයක සිට පැවත එන රු. 652,148, ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2007 නොවැම්බර් 15 දින දක්වා මහජන බැංකුවේ වෙනම ගිණුමක් පවත්වා 2008 වර්ෂයේ දී දෙපාර්තමේන්තු ප්‍රධාන ගිණුම හා ඒකාබද්ධ කිරීමට පෙර රු.651,797 ක වෙනස ඇති වී ඇත. මේ පිළිබඳව පරීක්ෂා කිරීමට පත් කළ කමිටුව යෝජනා කර ඇත්තේ වෙනසට බලපෑ ගනුදෙනු හඳුනාගෙන නිවැරදි කිරීමට පියවර ගත යුතු බවයි. ඊට අදාළ ලිපිලේඛන නොමැති බැවින් මෙම වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට ප්‍රමාද වනු ඇත. | වෙනස හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |
| (ආ) | පෙර වර්ෂයන් වෙනුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථානවලට යැවිය යුතු සියයට 60 ක, කුඹුරු ඉඩම් වෙනත් කාර්යය සඳහා යෙදවීමේ අවසරපත් ගාස්තුව වූ රු.4,484,078 ක් හා සමාලෝචිත වර්ෂයට අදාළව එසේ යැවිය යුතු වූ රු. 24,807 ක් වශයෙන් එකතුව රු. 4,508,885 ක් මූල්‍ය ප්‍රකාශනවල රු. 11,642,560 ක් ලෙස දක්වා තිබුණු අතර රු. 7,133,675 ක් වූ වෙනසට හේතු පැහැදිලි කර නොතිබුණි. | ගෙවිය යුතු අවසර පත්‍ර ගාස්තු ගණනයේදී ඉඩම් අවසර පත්‍ර සඳහා ප්‍රධාන කාර්යාලයට ලද මුදලින් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ගෙවිය යුතු සියයට 60 ගණනය කිරීමෙන් පසුව ගෙවිය යුතු අවසරපත් ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කෙරේ.ඒ සඳහා එලදා අලෙවි අංශය වෙතින් ලබාදෙන තොරතුරු සංසන්දනය කර නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | වර්ෂයට අදාළ ආදායම නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රෝද 02 ට්‍රැක්ටර් ණයගැති, රෝද 04 ට්‍රැක්ටර් ණයගැති හා 2KR ජල පොම්ප ණයගැති ශේෂයන් උප ලේඛනවල දැක්වෙන ශේෂයන් සමඟ රු. 10,412,595 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට නිලධාරින් දැනුවත් කරන ලදී. | මූල්‍ය ප්‍රකාශන ශේෂයන් සමග උප ලේඛන සම විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | අරමුදලේ සේවා අංශයේ ලේඛන අනුව, පෙර වර්ෂවලට අදාළ හිඟ අක්කර බදු ආදායම රු. 41,398,774 ක් වූ අතර එම හිඟයෙන් අරමුදලට ලැබිය යුතු සියයට 20 ක අක්කර බදු ආදායම රු. 8,279,755 කි. එහෙත් පෙර වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 20,657,106 ක අක්කර බදු ආදායමක් අරමුදලට ලැබී තිබුණු අතර එම නිසා හිඟ අක්කර බදු ආදායම නිවැරදිව ගිණුම්ගත කර නොමැති බව නිරීක්ෂණය විය. | පෙර වර්ෂ හිඟ අක්කර බදු මුදල් ප්‍රමාණය වෙන් වෙන්ව ලබා ගැනීමට 2023 වර්ෂයේ සිට ගුගල් පත්‍රයක් සකස් කර සියලුම දිස්ත්‍රික් කාර්යාල වෙත යොමුකර පෙර වර්ෂයන් සඳහා ලැබිය යුතු අක්කර බදු ආදායම් නිවැරදි හඳුනාගැනිමට කටයුතු කර අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලබන බව දන්වනු ලැබේ. | ආදායම නිවැරදිව හඳුනාගත යුතුය. |

**1.5.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට සිදුකරන ලද ගැලපීම් සඳහා වූ ජර්නල් සටහන් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම සිදු කරන ලද ගැලපීම් වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය. | 2022 වර්ෂයේ සමුච්චිත අරමුදලෙහි ගැලපීම් වලට අදාළ ජර්නල් සටහන් අතපසුවීමකින් ලෙජර් ගිණුම් වලට ඇමුණුම් ලෙස දැක්වීමට නොහැකි විය. | ගැලපීම්වලට අදාළ සියලුම ජර්නල් සටහන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | අරමුදල මගින් වර්ෂ ගණනාවකට පෙර මිළදීගෙන ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇති රු. 4,870,082 ක් වූ පරිගණක මෘදුකාංග පද්ධතියේ භෞතික පැවැත්ම සහ උපයෝජනය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි. භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර පද්ධතියේ පැවත්ම තහවුරු කර ගෙන නොතිබුණි. | අරමුදල මගින් වර්ෂ ගණනාවකට පෙර මිළදීගෙන ස්ථාවර වත්කම් ලෙස දක්වා ඇති රු. 4,870,082 ක් වූ පරිගණක මෘදුකාංග පද්ධතිය පිළිබඳ තොරතුරු භාණ්ඩ සමීක්ෂණයෙන් පසු විගණනයට ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ලැබේ. | පරිගණක මෘදුකාංග පද්ධතිය පවතීද යන්න සහ එය උපයෝජනය කෙරෙන්නේද යන්න තහවුරු කර ගත යුතුය. |

**1.6. ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන හා ගොවි සංවිධාන වෙත 2010 වර්ෂයේදී ලබාදී තිබුණු රෝද 02 ට්‍රැක්ටර් ට්‍රේලර් හා රෝද 04 ට්‍රැක්ටර් ට්‍රේලර් සඳහා වර්ෂ 10 ක කාලයක සිට අයවිය යුතු රු. 4,112,575 ක මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාරික අයකර ගැනිම සඳහා ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයන්හි අදාළ පාර්ශවයන් දැනුවත් කර උපදෙස් ලබා දී වාරික අයකරගැනිමේ කටයුතු සිදුකරමින් පවතී. ණය මුදල් අයවීමේ සීඝ්‍රතාවය අඩු මට්ටමක පවතී. | ණය ශේෂ නොපමාව අයකර ගත යුතුය. |
| (ආ) | ජපන් යෙන් ආධාර ව්‍යාපෘතිය යටතේ 2006, 2008, 2010 හා 2012 වර්ෂවල ලබාදී ඇති රෝද 02 ට්‍රැක්ටර් සඳහා අයවිය යුතු මුදල් 2015 වන විට අයකර ගත යුතු වුවත් රු. 112,401,379 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජපන් යෙන් ආධාර ව්‍යාපෘතිය යටතේ 2006, 2008, 2010 හා 2012 වර්ෂවල ලබාදී ඇති රෝද 02 ට්‍රැක්ටර් සඳහා 2022 දෙසැම්බර් 31 දින වනවිට රු. 111,325,484 ක මුදල අයකර ගැනීම සඳහා ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයන් හි අදාළ පාර්ශවයන් දැනුවත් කර උපදෙස් දී ඇත. ණය මුදල් අයවීමේ සීඝ්‍රතාවය අඩු මට්ටමක පවතී. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ණයගැතියන්ගේ ශේෂයන් තුළ ඇතුළත් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයවිය යුතුව පවතින රු. 2,464,983 ක 2KR ව්‍යාපෘතිය ජල පොම්ප වාරික හා රු. 19,617,600 ක රෝද 04 ට්‍රැක්ටර් වාරික ශේෂයන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂ 05කට වැඩි අයවිය යුතු රු. 2,501,983 ක KR ව්‍යාපෘතිය ජල පොම්ප වාරික හා රු. 10,640,000 ක රෝද 04 ට්‍රැක්ටර් වාරික ශේෂ ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයන්හි අදාළ පාර්ශවයන් දැනුවත් කර උපදෙස් ලබා දී ඇත. මේ වන විට වාරික අයකර ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින අතර ඊට අදාළව අයවීමේ සීඝ්‍රතාවය අඩු මට්ටමක පැවතියද මේ වන විට ක්‍රමයෙන් අයවෙමින් පවතින බව දන්වනු ලැබේ. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| | නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 97(2)(ඉ) හා ගොවිජන සේවා කොමසාරිස්ගේ අංක 439/92 හා 1992 අගෝස්තු 03 දිනැති චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව අක්කර බදු සියයට 20 ලැබිය යුතු ආදායම රු. 12,271,249 ක් අය කරගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම සියයට 20 අක්කර බදු දායක මුදල් අයවීම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | අක්කර බදු ආදායම් සියයට 20 පිළිබඳ අවශ්‍ය තොරතුරු දිස්ත්‍රික් කාර්යාල හරහා ලබාගන්නා අතර මේ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් ණයගැති ලේඛනයක් අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් නඩත්තු කරනු ලැබේ. | අක්කර බදු දායක මුදල් අයවීම් පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු.රෙ. 104(4) හා 156 | ජලධාරා ඇල්බම් අනුක්‍රමික අංක යොදා ලේඛනගත කර, වගකිව යුතු නිලධාරියෙකු භාරයට පත් නොකර අනාරක්ෂිතව තැබීම හේතුවෙන් රු. 100,000 ක් වටිනා ජලධාරා ඇල්බම් 25 ක් වේයන් කා විනාශ වී ඇතත් එම අලාභයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර පියවර ගෙන නොතිබුණි. | මාළඹේ තත්වපාලනාගාරයේ වහලය මතට ගසක් කඩා වැටීම නිසා එහි ගබඩාකර තිබූ ජලධාරා ඇල්බම් 22 ක් හානි වී ඇති අතර ඒවා තොග පොතෙන් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. | කඩිනමින් පරීක්ෂණයක් නිම කළ යුතුය. |
| | (ii) මු.රෙ. 371 | තත්කාර්ය අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවත් සමාලෝචිත | මේ සම්න්ධයෙන් සේවා අංශය දැනුවත් කර මෙම තත්කාර්ය අතුරු අග්‍රිම 2023 වර්ෂයේ පියවීමට කටයුතු කරන ලෙසට | තත්කාර්ය අතුරු අග්‍රිම දෙන ලද කාර්යය නිම |

| | | | | |
|---|---|---|---|---|
| | | වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපිය වූ ශේෂය රු. 1,968,848 ක් වූ අතර 2019 දෙසැම්බර් 31 දින මාතලේ හා වවුනියාව ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරුන් වෙත ලබාදුන් රු.70,000 ක් හා රු. 85,000 ක් වූ අත්තිකාරම් මුදලක්ද ඇතුළත් වී තිබුණි. | නිලධාරීන් දැනුවත් කරන ලදි. | කළ වහාම පියවීමට කටයුතු කළ යුතුය. |
| | (iii) මු.රෙ. 756 | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂිකව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයේ වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදු කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී. | නිශ්චිත දිනයන් වලදී භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කළ යුතුය. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 53,166,640 ක් වන දේපළ පිරියත හා උපකරණ වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සටහන් සමග ඉදිරිපත් කර ඇති අතර, ස්ථාවර වත්කම් පිළිබඳ විස්තර අවසන් ගිණුමේ සටහන් මගින්ද ඉදිරිපත් කර ඇත. කෙසේ නමුත් ස්ථාවර වත්කම් සම්බන්ධ ලේඛණයක් ඉදිරියේදි නඩත්තු කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 49,078,658 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 8,441,249 ක් විය. ඒ අනුව මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු. 40,637,409 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අක්කර බදු ආදායම රු. 13,357,798 කින් වැඩිවීම, අවසර පත්‍ර ගාස්තු හා ඉඩම් ගොඩකිරීම් ආදායම රු. 11,733,145 කින් වැඩිවීම, කුවිතාන්සි පොත් හා කම්ටු මුදල් පොත් අලෙවි ආදායම රු. 4,892,000 කින් වැඩිවීම සහ මුළු වියදම රු. 12,728,376 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අරමුදල විසින් ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය හා ගොවිජන සංවර්ධන කාරක සභා සඳහා කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් සකස් කිරීමට රු. 30,970,000 ක වටිනාකමකට ගිවිසුම් ගතවී රු. 9,291,000 ක මුදලක් ගෙවීම් කර තිබුණද කිසිදු කාර්යයක් ආරම්භ කර නොතිබුණි. | සියලු ගොවි බැංකු ජාලගත කිරීමට අදාළ ආයතනය සමඟ රු. 2,000,000 ක Performance බැඳුම්කරයක් මගින් ගිවිසුම් ගතව ඇති අතර රු. 7,959,290 අත්තිකාරම් බැඳුම්කරයක් වෙනුවෙන් ද ගෙවීම් සිදුකර ඇත. එසේම මෙම ව්‍යාපෘතියට අදාළව අවශ්‍ය දත්ත හා තොරතුරු සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන ආවරණය වන පරිදි ලබාගෙන සියලුම ගොවි බැංකු, ගොවිජන සංවර්ධන කාරක සභා සඳහා මෙන්ම පොතුහැර තොරතුරු තාක්ෂණ ඒකකය හා ප්‍රධාන කාර්යාලයේ ගොවි බැංකු අංශය, සේවා අංශය සම්බන්ධ වී පැවැත්වීමට කටයුතු සිදු කෙරුණි. ඒ අනුව නිම කරන ලද Digital පද්ධතිය සාර්ථක තොරතුරු පද්ධතික් ලෙස මේ වන විට සංවර්ධනය වී ඇත. | මෘදුකාංග පද්ධතිය අදාළ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වර්ෂ 10 කට වඩා පැරණි රු. 450,000 ක තොග ඌනතාවයක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 1996 වර්ෂයේ සිට අරමුදලේ අවසන් ගිණුම් වල ඌනතාවය පරීක්ෂාවට පත් කර ඇති කමිටුව විසින් මීට සම්බන්ධ පාර්ශවයන්ගෙන් පරීක්ෂණයක් පැවැත්වීමට සුදුසු බව නිර්දේශ කර ඇත. මේ පිළිබඳව විනය අංශය ද දැනුවත් කොට ඒ අනුව ඉදිරියේදී නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | පරීක්ෂණයක් සිදු කර අලාභය අය කරගත යුතුය. |
| (ඇ) | තණමල්විල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ හෙළ බොජුන්හල ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් අතරමග නවතා දැමීම හේතුවෙන් ඒ සඳහා දරන ලද රු. 2,224,119 ක වියදම නිෂ්කාර්ය වී තිබුණි. සිදු වූ අලාභය වෙනුවෙන් කාර්යසාධන සුරක්ෂණය මුදල් කරගෙන තිබුණද ගිවිසුමේ සඳහන් පරිදි නොකළ වැඩ වටිනාකමින් සියයට 20 කට සමාන රු. 626,693 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොගෙන මුදල් ගෙවා තිබුණි. | 2022.03.31 දින අදාළ ඉදිකිරීම් සම්බන්ධව අවසන් බිල්පත් කොන්ත්‍රාත්කරු විසින් 2022.05.04 වන දින ඉදිරිපත් වුවද අදාළ බිල්පත් නිර්දේශය හා අනුමැතිය දීමේ ප්‍රමාදය ඉතිරි වැඩ සඳහා ගෙවිය යුතු වටිනාකමින් සියයට 20 ක වටිනාකම අයකර නොගත් නමුත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන තීරණය මත කොන්ත්‍රාත්තුව හා ගිවිසුම අවලංගු කර රු.267,879 ක කාර්යසාධන සුරක්ෂණ මුදල් කර ඇත. තවද මෙතෙක් කළ වැඩ වෙනුවෙන් අධ්‍යක්ෂ ඉංජිනේරු නියමන කරන ලද වටිනාකමට යටත්ව රු. 1,120,482 ක මුදල සඳහා පමණක් ගෙවීම් සිදු කර ඇත. | ඉටු නොකළ වැඩ කොටස් වෙනුවෙන් අය කළ යුතු වටිනාකම වගකිව යුතු නිලධාරීන්ගෙන් කඩිනමින් අයකර ගත යුතුය. ඉදිකිරීම් වැඩ නොපමාව නිම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 සැප්තැම්බර් 15 හා 16 යන දෙදින තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවති ගොවිජන සේවා කාරක සභා සාමාජිකයන් සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන වෙනුවෙන් රු. 4,286,755 ක වියදමක් දරා තිබුණද ඒ සඳහා නම්කළ පුද්ගලයින් සහභාගී නොවීම නිසා අහාරපාන සහ නවාතැන් සඳහා රු. 89,710 ක් අනාර්ථිකව ගෙවා තිබුණි. | මේ සම්බන්ධයෙන් අදාළ පියවර ගැනීම සඳහා අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල වෙත දන්වා ඇත. | පුහුණු වැඩ වෙනුවෙන් තොරාගත් නිලධාරීන් සහභාගී වීම අනිවාර්ය කළ යුතුය. |
| (ඉ) | 2010 වර්ෂයේදී ජපන් යෙන් ආධාර යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මරදන්කඩවල ගොවිජන සේවා මධ්‍යස්ථානයට ලබාදී තිබුණු රෝද 02 ට්‍රැක්ටර් රථ 02 ක් ගොවීන්ට ලබා නොදී කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරිය විසින් භාවිතා කිරීම සහ සන්තකව තබාගැනීම නිසා ඇයට විරුද්ධව 2016 මාර්තු 10 දින විනය කටයුතු ආරම්භ කර 2021 ජනවාරි 14 දින මෙම නිලධාරිනිය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 හා 12 වගන්ති යටතේ විශ්‍රාම ගන්වා තිබුණද සිදුකර ඇති අලාභය වූ රු. 355,000 ක මුදල 2023 පෙබරවාරි 28 දින දක්වා අය කරගෙන නොතිබුණි. | මේ වන විට මේ සම්බන්ධ තොරතුරු සේවා අංශය සතු නොවන අතර අදාළ ක්‍රියාමාර්ග ඉදිරියේදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. | නොපමාව විනය ක්‍රියාමාර්ග අවසන් කිරීම හා අලාභය අයකර ගත යුතුය. |

## 4. කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2000 වර්ෂයේ සිට අරමුදලේ කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. | කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

## 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අයවැයගත ආදායම් හා තත්‍ය ආදායම් විෂයයන් 06 ක සියයට 3.88 සිට සියයට 185.16 දක්වා විචලනයන් පැවතුණි. | ආදායම් විචලනයට බලපෑ සාධක ලෙස සියයට 20 අක්කර බදු අක්කරයකින් අයකරන මුදල වැඩි කිරීම සහ වගා කරනු ලබන කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයෙහි ඉහළ යාම අක්කර බදු වැඩිවීමට හේතු වී ඇත. කුවිතාන්සි පොත් අලෙවි ආදායම 2022 වර්ෂයේ මුල් කාර්තුවෙහි රට තුළ පැනගැගුණු ඉන්ධන ගැටලුව එම ආදායමට සාපේක්ෂව අඩු වීමට හේතු වී ඇත.කම්ටු මුදල් පොත් අලෙවි ආදායම 2022 වර්ෂයෙහි රු. 1300 කට පැවති කම්ටු මුදල් පොත් පළමුව රු. 2100 කටද ඉන් පසුව සංශෝධිත නව මිළ රු. 3950 ක් ලෙසත් මිලෙහි සිදු වූ වැඩි වීම මත අපේක්ෂිත | වඩා නිවැරදිව අයවැය සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ආදායම වැඩි වීමට හේතු වී ඇත.රෝද 02 හා රෝද 04 ට්‍රැක්ටර් හා ජල පොම්ප වාරික ලැබීම් අයවීමේ සීඝ්‍රතාවය අඩු මට්ටමක පැවතිය ද ක්‍රමයෙන් අයවෙමින් පවති. ඉඩම් අවසරපත් නිකුත් කිරීමේ ආදායම ඇස්තමේන්තු කරනුයේ පෙර වර්ෂයේ ලද තත්‍ය ආදායම මත වීම හේතුවෙන් පසු වර්ෂයේ අයවැයගත ආදායමෙන් මෙම වර්ෂයේ තත්‍ය ආදායම වෙනස් වීමට හේතුවේ. තවද කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන් සඳහා යෙදවීමට ලැබෙන ඉල්ලීම් ප්‍රමාණය වාර්ෂිකව ඉහළ යාම ඒ හේතුවෙන් මඩකළපුව සහ යාපනය දිස්ත්‍රික්ක වලින් ලද සේවා ගාස්තු මුදල ඉහළ අගයක් ගැනීම ද මීට හේතු විය. | |
| (ආ) | අයවැයගත වියදම් හා තත්‍ය වියදම් විෂයයන් 04 ක සියයට 14 සිට සියයට 100 දක්වා විචලනයන් පැවතුණි. | නව කෘෂිකර්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීමටත්,කාර්යාල ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා එනම් ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය හා ගොවිජන සංවර්ධන කාරක සභා සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමට රු. 12,000,000 ක් වෙන් කර ඇත. ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව MGH Associates ආයතනය රු. 9,291,000 ගෙවීම් කර ඇත රු.මිලියන 1.5 වටිනාකමකින් යුතුව පරිගණක යන්ත්‍ර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් මිලදී ගන්නා ලදී.ඒ අනුව වෙන් වූ රු.මිලියන 15න් රු.10,791,000 වියදමක් දරා ඇත. | අයවැය ලේඛනය වඩා නිවැරදිව සකස් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සකස් කළ අයවැය ලේඛනය අනුව ගොවිජන කේන්ද්‍රය පරිපාලනය කිරීම හා සංවර්ධනය කිරීමට වර්ෂය තුළ කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි. | ගොවිජන කේන්ද්‍රය පරිපාලනය කිරීම හා සංවර්ධනය කිරීම 2022 වර්ෂය සිදු නොකළ අතර ඒ ක්‍රියාකාරකම් 2023 වර්ෂයේ දි ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. 2022 වර්ෂය සඳහා නව කෘෂිකර්ම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම යටතේ වෙන් වූ රු.මිලියන 15 න් රු. 10,791,000 විදමක් දරා ඇත. | අයවැය ලේඛනයේ ඇතුළත් කාර්යයන් වර්ෂය තුළ ඉටු කළ යුතුය. |